;

[අන්තර්ජාල අනුවාදය]

ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

# 1999 අංක 22 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකුව (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1999 අගෝස්තු මස 12 වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1999 අගෝස්තු මස 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 5. 75 තැපැල් ගාස්තුව: රු.3.50 යි.

**1999 අංක 22 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකුව (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1999 අගෝස්තු මස 12 වන දින.]

එල්. ඩී. - ඕ. 8/98

**1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 1999 අංක 22 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකුව (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ — ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ : — 1971 අංක 30 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියෙහි (3) වන උපවගන්තියෙහි "බැංකුවේ මුද්‍රාව" යන වචන වෙනුවට "(4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව බැංකුවේ මුද්‍රාව" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියෙහි (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්,

"(4) අසනීපයක් හෝ තාවකාලිකව ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ මණ්ඩලයේ සාමාජිකත්වයේ පුරප්පාඩුවක් තිබීම නිසා හෝ (3) වන උපවගන්තිය යටතේ. සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මුද්‍රාව තැබිය නොහැකි වූ අවස්ථාවක දී බැංකුවේ එක් සාමාජිකයකු සහ බැංකුවේ සාමාන්‍යාධිකාරිවරයා ඉදිරිපිට දී ඕනෑම සාධන පත්‍රයකට හෝ ලියවිල්ලකට මුද්‍රාව තැබීම කළ හැකි වේ".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :- — ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් :-

"(1) බැංකුවෙහි ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය කොළඹ පිහිටා තිබිය යුතු අතර, බැංකුවේ ව්‍යාපාර

කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය විය හැකි ශාඛා තබා ගැනීම සහ නියෝජිත ආයතන හා අනුයෝජිතයන් පත් කිරීම ද කරනු ලැබිය හැකි ය; තවද තැන්පතු ජංගණනය කිරීමේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත අනුයෝජිතයන් පත් කිරීම සහ නියෝජිත කාර්යාල පිහිටුවීම ද කළ හැකි ය; " ;සහ

(2) ඒ වගන්තියෙහි (2) වන උපවගන්තියේ "නියෝජිත ආයතනයක් හෝ නියෝජිතයකු වශයෙන් බැංකුව විසින් පත් කළ හැකිය.",යන වචන වෙනුවට "අනුයෝජිතයකු වශයෙන් බැංකුව විසින් පත් කළ හැකි ය". යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. 1995 අංක 28 දරන පනතින් සංශෝධිත පරිදි ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

(1) "මේ පනතේ විධිවිධානවලට" යන වචන වෙනුවට "මේ පනත හෝ වෙනත් නීතියක් යටතේ සාදන ලද නියෝගයන් හෝ නිකුත් කරන ලද විධාන ඇතුළුව, මේ පනතේ සහ එකී වෙනත් නීතියක විධිවිධානවලට," යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ උපවගන්තියෙහි (අ) ඡේදයෙහි "ඉතිරි කිරීමේ ගිණුම් විවෘත කිරීම සහ ඉතිරි කිරීමේ සහතික නිකුත් කිරීම"යන වචන වෙනුවට "ඉතිරි කිරීමේ සහතික හෝ ඉතිරි කිරීම් ජංගණය කිරීමට බැංකුවට හැකි කරවන වෙනත් යම් සාධන පත්‍රයක් හෝ නිෂ්පාදනයක් " යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ උපවගන්තියෙහි (ඉ) ඡේදයේ "ස්වකීය ගණුදෙනුකරුවන්ගේ තැන්පතුවල ඇපය මත" යන වචන වෙනුවට "ස්වකීය ගණුදෙනුකරුවන්ගේ තැන්පතුවල ඇපය මත හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් යම් ඇපයක් හෝ ඇප වීමක් මත" යන වචන ආදේශ කිරීමෙන් ;

(4) ඒ උපවගන්තියෙහි (ඊ) ඡේදයේ "ඇප මත, නිවාස ණය සැපයීම" යන වචන වෙනුවට "ඇප මත නිවාස ණය හෝ වාණිජ්‍යමය නොවන අරමුණු සඳහා වෙනත් ණය සැපයීම" යන වචන ආදේශ කිරීමෙන් ;

(5) ඒ උපවගන්තියෙහි (ඌ) ඡේදයේ "යම් නිශ්චල හෝ චංචල දේපළක් හෝ ඒ දේපළ පිළිබඳ යම් අයිතිවාසිකමක් අත්කර ගැනීම " යන වචන වෙනුවට "මිලට ගැනීමෙන් බද්දට ගැනීමෙන්, හුවමාරු කිරීමෙන්, කුළියට ගැනීමෙන්, හෝ අන්‍යාකාරයකින් යම් නිශ්චල හෝ චංචල දේපළක් හෝ ඒ දේපළ පිළිබඳ යම් අයිතිවාසිකමක් අත්කර ගැනීම" යන වචන ආදේශ කිරීමෙන්;

(6) ඒ උපවගන්තියේ (ඒ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"(ඒ) මණ්ඩලය විසින් අනුමත කරන ලද මූල්‍යායතන සහ මිල ලැයිස්තුගත සමාගම් මගින් නිකුත් කරන ලද හෝ ඇප වන ලද මුදල් සාධන පත්‍ර වෙළෙඳාම් කිරීම; ";.

(7) ඒ උපවගන්තියේ (ඒ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද එකතු කිරීමෙන්:-

"(ඔ) මධ්‍යම සහ දීර්ඝ කාලීන ව්‍යාපෘති සඳහා නැවත ණය දීමේ කාර්යය උදෙසා බලපත්‍රලාභී වාණිජ බැංකුවලට සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට ප්‍රතිමූල්‍ය පහසුකම් සැළසීම;

(ඕ) තැන්පතුවලට ප්‍රතිපක්ෂව ඇපකර ලිපි නිකුත් කිරීම;

(ක) දේශීය සහ ජාත්‍යන්තර ආයතන හෝ නියෝජ්‍ය ආයතනවලින් මුදල් ණයට ගැනීම;

(ග) ලොතරැයි සහ ත්‍යාග තරග පැවැත්වීම;

(ච) යම් බලපත්‍රලත් වාණිජ බැංකුවක හෝ බලපත්‍ර ලත් විශේෂ බැංකුවක හෝ බලපත්‍රලත් වානිජ බැංකුවක නැතහොත් බලපත්‍රලත් විශේෂ බැංකුවක උපකාරක ආයතනයක හෝ බලපත්‍රලත් කොටස් හුවමාරුපොලක ලැයිස්තුගත කළ හෝ ලැයිස්තුගත කිරීම අපේක්ෂා කරන හෝ පොදු සමාගමක, සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙහි ආයෝජනය කිරීම;

(ජ) අනේවාසිකයන් සඳහා රුපියල් ගිණුම් විවෘත කිරීම;

(ට) තැන්පතුකරුවන්ගෙන් විදේශ ව්‍යවහාර මුදල් එකතු කිරීම සහ මෙරට මුදල්වලට අපවර්තනය කිරීම;

(ඩ) සේවාදායකයන්ට ආරක්ෂක භාරය සහ සුරැකි අත්භාරය සුරැකි තැන්පතු ලෙස යතුරු දමා වැසීමේ පහසුකම් සැළසීම;

(ණ) මුල්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව උකස් බඩු ව්‍යාපාර පවත්වාගෙන යෑම;

(ත) මුදල් මාරුකිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැළසීම;

(ද) මුල්‍ය මණ්ඩලයේ ලිඛිත අනුමැතිය ඇතිව උපකාරක සමාගම් පිහිටුවීම;

(න) භාර සහ බූදල පරිපාලනය භාර ගැනීම;

(ප) ඉහත සඳහන් කාර්තව්‍ය සහ ක්‍රියාකාරකම්වලට ආනුෂංගික හෝ හිතකර විය හැකි වෙනත් යම් ක්‍රියාකාරකම්වල යෙදීම.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම

5. 1995 අංක 28 දරන පනතින් සංශෝධිත පරිදි ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය එහි (1) වන උපවගන්තියේ “බැංකුවේ සාමාන්‍යාධිකාරිවරයා” යන වචන වෙනුවට “බැංකුවේ ප්‍රධාන විධායක නිලධරයා වන බැංකුවේ සාමාන්‍යාධිකාරිවරයා” යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥාප්තියේ 26අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

6. 26 වන වගන්තියට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර,එය ප්‍රධාන ප්‍රඥාප්තියේ 26 අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:-

“සාමාන්‍යාධිකාරි වරයා සහ වෙනත් යම් නිලධරයකු වෙත බලතල පැවරීම.

26අ (1) බලය පැවරීම සඳහා මණ්ඩලය විසින් සම්මත කරගනු ලබන යෝජනා සම්මතයක සඳහන් යම් නියම හා කොන්දේසිවලට යටත්ව මණ්ඩලය විසින් ඒ යෝජනා සම්මතය මගින් බැංකුවේ යම් කර්තව්‍ය හෝ ක්‍රියාකාරකම් කිසිවක් බැංකුවේ

සාමාන්‍යාධිකාරිවරයාට හෝ වෙනත් යම් නිලධරයකුට හෝ කලින් කල පවරනු ලැබිය හැකි අතර, එවැනි යම් පැවරීමක් මණ්ඩලය විසින් අවලංගු කිරීම හෝ අස්කර ගැනීම ද කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ බැංකුවේ සාමාන්‍යාධිකාරිවරයාට හෝ බැංකුවේ වෙනත් යම් නිලධරයකුට යම් බලතල පැවරීමක් කරනු ලැබුව ද, එසේ පවරන ලද කර්තව්‍යයක් හෝ කටයුත්තක් ඉටු කිරීමට හෝ ක්‍රියාත්මක කිරීමට අයිතිවාසිකමක් මණ්ඩලයට ඇත්තේ ය.

7. 1995 අංක 28 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

"පොළිය ගෙවිය යුතු බව

41. හිමිකම්පානු නොලැබූ තැන්පතු සංචිතයක මුදල් තැන්පත් කර තිබූ කාලසීමාව සඳහා ඒ සංචිතයට මාරු කරන ලද මුදල් මත පොළිය ද ඇතුළුව, බැංකුවෙහි තැන්පත් කරන ලද මුදල් මත මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි අනුප්‍රමාණවලට අනුව බැංකුව විසින් පොළී ගෙවනු ලැබිය යුතු ය."

8. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 41 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :-

ප්‍රධාන ප්‍රඥාප්තියේ 42 වන වගන්තිය ඇතුළත් කිරීම.

"පොළියට අමතරව ගෙවීම්.

42. මණ්ඩලය විසින්, නිශ්චිතව දක්වනු ලැබිය හැකි ගිණුම් පන්ති සඳහා සහ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි අනුප්‍රමාණවලට අනුව පොළියට අමතරව ගෙවීම් කරනු ලැබිය හැකි ය."

9. 1995 අංක 28 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තියේ (4) වන උප වගන්තියෙහි "එම ගිණුමේ තිබුණු මුදල් ප්‍රමාණයට සමාන මුදලක් හිමිකම් පාන්නාට ගෙවා" යන වචන වෙනුවට "41 වන වගන්තිය යටතේ මණ්ඩලය විසින්

ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය සංශෝධනය කිරීම.

තීරණය කරනු ලැබිය හැකි අනුප්‍රමාණවලට අනුව ගණන් බලනු ලැබූ පොළිය ද සමඟ ගිණුමේ තිබූ මුදලට සමාන මුදලක් හිමිකම් පාන්නාට ගෙවා" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

10. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 78 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥාප්තියේ 79 වන වගන්තිය ලෙස බලාත්මක විය යුතුය:-

"උකස් කරුවන්ගේ ආඥාපනත ආදාල නොවිය යුතු බව

79. (90 වන අධිකාරය වූ) උකස්කරුවන්ගේ ආඥාපනතේ විධිවිධාන බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන උකස් ව්‍යාපාරය සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 87 වන වගන්තිය සංශෝධනය කිරීම

11. 1995 අංක 28 දරන පනතින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 87 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) "භාරකරු" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ කථනය ආදේශ කිරීමෙන් :-

"බලපත්‍රලාභී වාණිජ බැංකුව සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුව" යන්නෙහි 1988 අංක 30 දරන බැංකු පනතේ පිළිවෙලින් ඒවාට දී ඇති අර්ථය ම තිබිය යුතුය; සහ

(2) "ඉතිරිකිරීමේ සහතිකය" යන යෙදුමෙහි අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් "

"ඉතිරිකිරීමේ සාධන පත්‍රයක් හෝ ප්‍රදර්ශකයක්" යන්නෙන්, ඉතිරිකිරීම් ජංගණනය කිරීම සඳහා බැංකුවට හැකිවන යම් සාධන පත්‍රයක් හෝ ප්‍රදර්ශකයක් අදහස් වේ ".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

12. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු.870 කි. (විදේශීය) රු.1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.